# කාන්තා අධ්‍යයනය පිළිබඳ 15 වැනි ජාතික සම්මේලනය

## දෙසැම්බර් 2016

## සම්මේලනයේ තේමාව - ස්ත්‍රී පුරුෂ සමාජ භාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය

## සංක්ෂිප්ත ලිපි සඳහා කැඳවීම



කාන්තා පර්යේෂණ කේන්ද්‍රය මගින් පවත්වනු ලබන 15 වැනි ජාතික සම්මේලනය, ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට එරෙහි සංසදය සමග එකතුව ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට එරෙහිව දින 16ක් තුළ පැවැත්වෙන ක්‍රියාදාමයට සමගාමීව 2016 දෙසැම්බර් මස 2 වැනි හා 3 වැනි දිනයන්හි පවත්වනු ලැබේ. ඔබගේ පර්යේෂණ අධ්‍යයනයන්හී ප්‍රතිඵල, ඇගයීම් හෝ ක්‍රියාකාරි වැඩසටහන්වල විස්තර මෙම සම්මේලනයට ඉදිරිපත් කරන ලෙස සාදරයෙන් ඇරයුම් කරමු. ඔබගේ ඉදිරිපත් කිරීම් දේශීය භාෂාවෙන් (සිංහල, දෙමළ) හෝ ඉංග්‍රීසි භාෂාවෙන්, ඉදිරිපත් කළහැකි අතර දුරස්ථ ස්ථානවල සිට අන්තර්ජාලය හරහා ඉදිරිපත් කිරීම් කළ හැක. ඉදිරිපත් කිරීම් ලිඛිත පත්‍රිකා, විඩියෝ හෝ පෝස්ටර් මගින් කළ හැක.

### අනු තේමාවන්



1. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය / සහකරු හෝ සහකාරිය විසින් සිදුකරන ප්‍රචණ්ඩත්වය
2. ව්‍යාභිචාරය / දූෂණය
3. ළමා අපචාර
4. සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාවට එරෙහිව සිදුවන ප්‍රචණ්ඩත්වය
5. කාන්තාවන්, නවයොවුන් වියේ පසුවන්නන් හා ළමුන්ට එරෙහිව සිදුවන සයිබර් ප්‍රචණ්ඩත්වය, හිංසනය සහ සූරාකෑම
6. ලිංගික හිංසනය - සේවා ස්ථානය, පොදු ස්ථාන. අධ්‍යාපනික ආයතන හා වෙනත් රජයේ සහ පෞද්ගලික ආයතන, දේශපාලන ආයතන හා විනෝදාත්මක සංදර්ශන ආදිය
7. සංක්‍රමණික කාන්තාවන්ට එරෙහිව සිදුවන හිංසනය හා ලිංගික ප්‍රචණ්ඩත්වය
8. කුට්ටනය
9. ප්‍රචණ්ඩත්වයට තුඩුදෙන ඩිජිටල්, ඉලෙක්ට්‍රොනික හා මුද්‍රිත මාධ්‍ය වල කාන්තා ප්‍රතිරූපණය
10. ස්ත්‍රි පුරුෂ සමාජභාවය මත පදනම්වූ ප්‍රචණ්ඩත්වය නිසා සිදුවන ආර්ථික හා සමාජීය බලපෑම
11. නෛතික හා ආයතනික රාමු
12. යහපත් ක්‍රියා මාර්ග
13. ස්ත්‍රි පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට අදාළ වෙනත් නිශ්චිත ක්ෂේත්‍ර

මේ සඳහා ඉදිරිපත් කරන පර්යේෂණ පත්‍රිකා මීට පෙර ප්‍රකාශ නොකළ තමාගේම නිර්මාණයක් විය යුතුය. සියළුම සංක්ෂිප්ත හා පර්යේෂණ පත්‍රිකා මෙම ක්ෂේත්‍රයේ සමානයන් සමාලෝචනයට ලක් කෙරේ. සියළුම සංක්ෂිප්ත ලිපි ඇතුළත් ග්‍රන්ථයක්ද මුද්‍රණය කෙරේ.

### කාල රාමුව

- ☞ 03, ඔක්තෝබර් 2016 - වචන 250 නොවැඩි සාරාංශ ලිපි විද්‍යුත් තැපල් මගින් ඇමුණුමක් ලෙස පහත විද්‍යුත් ලිපිනය natcon2016.cenwor@gmail.com මගින් සම්බන්ධීකරන නිලධාරිනිය වෙත එවිය යුතුය.
- ☞ 10, ඔක්තෝබර් 2016 - සංක්ෂිප්ත ලිපි තෝරාගත් බව දැනුම් දීම
- ☞ 10, නොවැම්බර් 2016 - සම්පූර්ණ ලිපිය ඉදිරිපත්කිරීම සඳහා අවසන් දිනය
- ☞ 24, නොවැම්බර් 2016 - සම්පූර්ණ ලිපිය තෝරාගත් බව දැනුම් දීම

ලිපි ඉදිරිපත් කළ යුතු ආකෘතිය සහ අනෙකුත් තොරතුරු සඳහා පිවිසෙන්න

**http://cenwor.lk/wp-content/uploads/2016/09/15th-National-convention-Web-text-2-call-for-abstract-sinhala-9Sep2016.pdf**

සියළු විමසීම්: සම්බන්ධීකරන නිළධාරිනි, **කාන්තා අධ්‍යයනය පිළිබඳ 15 වැනි ජාතික සම්මේලනය**


කාන්තා පර්යේෂණ කේන්ද්‍රය (CENWOR)
225/4, ශ්‍රීමත් බර්නාඩ් සොයිසා මාවත (කිරුළ පාර),
කොළඹ 5, ශ්‍රී ලංකාව.
දුරකථන: 011- 2369530 /011- 2502153
විද්‍යුත් තැපෑල (natcon2016.cenwor@gmail.com)